චක්‍රලේඛ අංක: 21 / 2016 .

මගේ අංක:ධබ/03/2016
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2016.07.27

සියලුම බන්ධනාගාර අධිකාරි සහ සහකාර අධිකාරීන් වෙත.

**වැඩ සහන ක්‍රමය මත දීර්ඝ කාලීන සිරකරුවන් සේවයේ යෙදවීම හා කෙටි කාලීන සිරකරුවන් පිටත සේවයේ යෙදවීම.**

ඉහත කරුණට අදාළව මගේ අංක ධබ/03/2013 හා 2013.10.10 දින නිකුත් කරන ලද 35/2013 චක්‍රලේඛය පහත සඳහන් පරිදි සංශෝධනය කරන අතර එම නියමයන් 2016.08.01 දින සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසට දන්වමි.

01..ඒ අනුව 35/2013 චක්‍රලේඛයේ අංක: 2.1 හා 2.2 යටතේ ඇති දීර්ඝ කාලීන හා කෙටි කාලීන සිරකරුවන් උපයන මුදලින් නිලධාරි ත්‍යාග අරමුදල සඳහා බැර කල 10% ක මුදල මින් ඉදිරියට එම අරමුදල වෙත බැර නොකිරීමටත්, **එම 10% මුදල, සිරකරුට ගෙවිය යුතු මුදලට එකතු කර** පහත පරිදි ගෙවීම් කරන ලෙසත් මෙයින් දන්වමි.

**02.1 වැඩ සහන ක්‍රමය මත යොදන සිරකරුවන් සඳහා වැටුප් ගෙවීම.**

| | | |
|---|---|---|
| දෛනික වැටුප | | රු: 500.00 |
| දිවා ආහාරය හා තේ සඳහා අඩුකිරීම් | | රු: 100.00 |
| ඉතිරි මුදල | | **රු: 400.00** |
| රජයේ ගිණුමට අඩු කිරීම | 10% | රු: 40.00 |
| සිරකරු සුභසාධක අරමුදලට අඩු කිරීම | 10% | රු: 40.00 |
| **ඒ අනුව සිරකරුට ගෙවිය යුතු මුදල** | **80%** | **රු: 320.00** |

43/2014 චක්‍රලේඛය පරිදි දැනට විශ්‍රාමික නිලධාරියෙකුට ගෙවනු ලබන රු: 700.00 ක දීමනාව හා සෙසු උපදෙස් එපරිදිම ක්‍රියාත්මක කල යුතුය.

**02.2 කෙටි කාලීන සිරකරුවන් පිටත සේවයේ යෙදවීම සඳහා වැටුප් ගෙවීම.**

| | | |
|---|---|---|
| දෛනික වැටුප | | රු: 500.00 |
| දිවා ආහාරය හා තේ සඳහා අඩු කිරීම් | | රු: 100.00 |
| ඉතිරි මුදල | | **රු: 400.00** |
| රජයේ ගිණුමට අඩු කිරීම | 10% | රු: 40.00 |
| සිරකරු සුභසාධක අරමුදලට අඩු කිරීම | 10% | රු: 40.00 |
| **ඒ අනුව සිරකරුට ගෙවිය යුතු මුදල** | **80%** | **රු: 320.00** |

43/2014 චක්‍රලේඛය පරිදි දැනට මේ සඳහා ආරක්ෂණ නිලධාරියෙකුට ගෙවනු ලබන රු: 700.00 ක දීමනාව හා සෙසු උපදෙස් එපරිදිම ක්‍රියාත්මක කල යුතුය.

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

**එච්.එම්.එන්.සී. ධනසිංහ**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ 09.**